# නාච්චාදූව වැවෙහි කිරි ඉතුරුම් මංගල්‍යය පිළිබඳ අධ්‍යයනයක්

ජී.ජේ.එම්.එස්. ජයසිංහ[1], ජේ.ජේ.එච්. කිරිමැටියාව[2]

ප්‍රමුඛ පදඃ කිරි ඉතිරවීම, නාච්චාදූව, වැව් මංගල්‍යය, අස්පර්ශීය, උරුමය

## හැඳින්වීම

උරුමය යනු පූර්ව පරම්පරාවන් විසින් ආරක්ෂා කොට වර්තමානයට භාරදී ඇති එසේම සැලකිය යුතු ජන කණ්ඩායමක් විසින් අනාගතයට භාරදීමට අපේක්ෂා කරන්නකි. උරුමය සංස්කෘතික හා ස්භාවික මෙන්ම ස්පර්ශනීය මෙන් ම අභෞතික අස්පර්ශනිය ද වේ. අස්පර්ශනීය සංස්කෘතික උරුමය යනු ප්‍රජාවන් කණ්ඩායමක් හෝ පුද්ගලයන්ගේ සංස්කෘතික උරුමය ලෙස කොටසක් හඳුනා ගනු ලබන ක්‍රියාකාරකම්, ප්‍රකාශන, දැනුම හා සම්බන්ධ උපකරණ ආදිය වේ. අස්පර්ශීය සංස්කෘතික උරුම අතරට කිරි ඉතිරවීමේ මංගල්‍යය ද හඳුනා ගත හැකිය. මෙම පත්‍රිකාව මගින් නාච්චාදූව වැවෙහි කිරි ඉතුරුම් මංගල්‍යය පිළිබඳ සුවිශේෂිතා පිළිබඳ අධ්‍යයනය කිරීම සිදු කරනු ලබයි. නාච්චාදූව වැවෙහි කිරි ඉතුරුම් මංගල්‍යයේ වර්තමාන තත්ත්වය කෙබඳුද? යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ගැටළුව විය.

## ක්‍රමවේදය

නාච්චාදූව වැවේ කිරි ඉතුරුම් මංගල්‍යය පැවති දින ක්ෂේත්‍ර නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ සහභාගීත්ව නිරීක්ෂණය මගින් මෙම පර්යේෂණය සිදු කරන ලදි. සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් නාච්චාදූව වැවෙහි කිරිඉතුරුම් මංගල්‍යය වර්තමාන තත්ත්වය කෙබඳු ද යන්න අධ්‍යයනය කර තොරතුරු රැස් කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

කිරි ඉතිරවීමේ මංගලය වියලි කලාපයේ සෑම ගමකම දැක ගත හැකි වැව් මංගල්‍යයකි. නුවර කලාවියේ කමත, දේවාල ඇතුළු විවිධ කාර්යයන් උදෙසා සිදුකෙරෙන කිරි ඉතුරු මංගල්‍යය විවිධ වේ. වැවක සිදු කරනු ලබන කිරි ඉතිරවීමේ මංගල්‍යය නුවර කලාවියේ සියලුම වැව්වල එකලෙස පවත්වනු ලබන්නකි. ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාච්චදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 506 ග්‍රාම නිලධාරී වසම තුළ මෙම වැව පිහිටා ඇත. කිරි ඉතිරවීමේ මංගල්‍යය ඉතා උත්කර්ෂවත් අන්දමින් සිදු කරනු ලබයි. කිරි ඉතිරවීමේ මංගල්‍යය කමතේ ගොයම් කපා පාගා අස්වැන්න ගෙට ගැනීමෙන් අනතුරුව ඊළඟ කන්නේ ආරම්භ කිරීමට පෙර සිදු කිරීම සම්මත සිරිත වෙයි.

[1,2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
swarnamalijayasinhe@gmail.com

කිරි ඉතුරුම් මංගල්‍යයේදී සෑම විටම කිරි ඉතුරුවා එයින්ම කිරිබත් උයා දෙවියන්ට පූජා කරනු ලැබේ. කිරි ඉතිරවීම සඳහා සහල් ලබා ගනුයේ කුඹුරක නෙළනු ලබන පළමු අස්වැන්නෙන් කොටසකි.

වැව වෙනුවෙන් පවත්වනු ලබන කිරි ඉතුරුම් මංගල්‍යයේදී පිදුම් ලබනුයේ පුල්ලෙයාර්, අයියනායක, කඩවර හෝ වැවට අධිපති දෙවියන් වේ. නාච්චාදූව වැවේ කිරි ඉතිරවීමේ මංගල්‍යය වැව් කන්දේම සංහිඳ නමින් හඳුන්වන ශුද්ධ ස්ථානයේ පවත්වනු ලබයි. සංහිඳ වැව් බැම්මේ පිහිටා ඇති විශාල සියඹලා ගසක් පාමුල සකසා තිබේ. ගස පාමුල පුල්ලෙයාර් දෙවියන්ගේ පිළිරුවක් නිමවා තිබේ. වැවේ පාර්ශ්වකරුවන් වන ගොවි මහතුන්ගෙන් එකතු කළ කළමනාවලින් කොටසක් දේවාලයේ කිරි ඉතිරුම් මංගල්‍යය සඳහා ගනු ලබයි.

වැවේ කිරි ඉතිරවීමේ දිනය නියම කරගත් පසු සහල් ඇතුළු පූජා භාණ්ඩ කිරි උතුරවන ස්ථානයට රැගෙන යනු ලැබේ. සියලුම ද්‍රව්‍ය රැගෙන යනු ලබන පිරිස අතරින් පිරිමි පාර්ශවය විසින් සංහිඳ පාමුල යහනක් සාදති. එහි සුදුපිරුවටක් එලා දේවාභරණ ඒ මත තැන්පත් කරති. මල් පහන් දල්වා දෙවියන්ට යාතිකා කර කිරි ඉතිරවීම ආරම්භ කරති. කිරි ඉතිරවීම සඳහා යොදා ගන්නා ප්‍රධාන මුට්ටියෙහි මෙන්ම අනෙකුත් මුට්ටි වටා ත්‍රිශූල තුනක් අඳිනු ලබයි. බොහෝ විට බුලතට කන හුණු වලින් මුට්ටියේ කටට පහළින් ඒ වටා මෝස්තර අඳිනු ලැබේ. ප්‍රධාන මුට්ටියට අමතරව සෙසු මුට්ටි හයක කිරි ඉතිරවීම සිදු කෙරේ

සෑම විටම වැවේ කිරි ඉතුරුම් මංගල්‍යයේ දී සහල් ගැරීම, පොල් ගෑම, කිරි මිරිකීම වැනි සියලු කටයුතු සඳහා වැවේ ජලය ම යොදා ගනු ලබයි. කිරි උතුරායාමෙන් පසු එම මුට්ටියට සහල් දමා කිරිබත් පිසනු ලැබේ. එම කිරිබතට සීනි, හකුරු, වියළි මිදී ආදි එකතු කිරීම සිදු කෙරේ. ඉන්පසු පහන් දල්වා බෙර වයමින් දෙවියන්ට යාතිකා කර අයියනායක,පුල්ලෙයාර් හා කඩවර දෙවිවරුන්ට කිරිබත් පුදනු ලැබේ. මේ අවස්ථාවේදී කපුරාල කෝල්මුර ගායනා කිරීම සිරිතකි. වැවේ කිරි ඉතුරුම් මංගල්‍යය සඳහා ගැමියෝ දෙවියන්ට සාම්ප්‍රදායිකව ඉල්ලීම් කරති. ඒ යළිත් වැවට වතුර පිරී, ගොවිතැන් කටයුතු පෙර ආකාරයට අලුත් බතින් කිරි ඉතුරුම් ඔප්පු කරන තුරු ගමේ සියලු දෙනා මෙන්ම කෙත් වතු ද ආරක්ෂා කර දෙන ලෙසිනි.

කිරිඉතුරුම් මංගල්‍යය අවසානයේ දී වැවට අධිපති දෙවියන්ට පිංපෙත් ලබාදී පොල් ගැසීම සිදු කරනු සිදුකරයි. අනතුරුව කිරි ඉතිරුම් මංගල්‍යයට සහභාගි වූ සියලු දෙනාට ම කිරිබත් සංග්‍රහ කරනු ලැබේ. නාච්චාදූව වැවේ කිරි ඉතිරුම් මංගල්‍යයේ ඇතැම් විශේෂ අංග ද විද්‍යාමාන වේ. මෙහිදී සුවිශේෂී අංගයක් වන මුට්ටි නැමීමේ මංගල්‍යය ද සිදුකරනු ලබයි. එහිදී වැවට කරනු ලබන කළගුණ සැලකීමක් මෙන් ම උපහාර පිදීමක් ලෙස ද ගැමියන් අතර මෙය ජනප්‍රිය වූ මංගල්‍යයකි. මෙහිදී  වැව සමීපයේ හෙවත් වැව් බැම්මේ එක් ස්ථානයක ගසක් සිටුවා එහි ම මුට්ටි කීපයක් ඉතාමත් ආරක්ෂිතව භක්තියකින් යුතුව හිස් මුදුනේ තබා බෙර වාදන හා ස්තෝත්‍ර ගායනා මැදින් පෙරහරින් යුතුව පැමිණ වැව් බැම්මේ ඉදිකළ ගස තුළට මෙම මුට්ටි නැමීම සිදු කරනු ලබයි. එමෙන්ම එම

අවස්ථාවේ දී වැවට උපහාර පිණිස බෙහෙත් කොටන ලද තුවක්කුවකින් වැව දෙසට වෙඩි මුර තුනක් ලබනු ලැබේ. අස්පර්ශීය සංස්කෘතික උරුමයක් වූ කිරි ඉතුරුම් මංගල්‍යය නාච්චාදූව වැවෙහි අතීතයේ සිට වර්තමානය දක්වා වසරක් පාසා පවත්වාගෙන යනු ලබන වැව් මංගල්‍යයකි.

**සමාලෝචනය**

වැව හා බැඳුණු දේව ඇදහිලි, වත් පිළිවෙත් හා පුද පූජා මෙම නාච්චාදූව වැවෙහි නොනැසී පැවැත්වීමට දක්වන දායකත්වයේ ඉමහත්ය. වැව රැක ගැනීම තුළින් ගම රැක ගැනීම යන සාමූහික අභිවෘද්ධියේ තේමා කොටගෙන සැකසී ඇති මෙම සියලු ඇදහිල විශ්වාස හා චාරිත්‍ර වාරිත්‍ර ඉදිරියේදීත් වැවේ අභිවෘද්ධියට මිසක අනර්ථකාරී දෙයකට හේතු නොවන බව කිව හැකිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

කුමාර, දළුපොත. (2003). ***මුට්ටි මංගල්‍යයේ වගතුග.*** පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.

**සම්මුඛ සාකච්ඡා**

පුංචි බණ්ඩා. (2003). නාච්චාදූව වැවේ කිරි ඉතුරුම් මංගල්‍යය. ජේ.ජේ.එච් කිරිමැටියාව, 2025/06/09.